# විශ්වවිද්‍යාල ප්‍රවේශය
# 2022/2023 අධ්‍යයන වර්ෂය

## විද්‍යාවේදී ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය ගෞරව උපාධි පාඨමාලාව

**මාධ්‍යය: ඉංග්‍රීසි**

ඉහත සඳහන් උපාධි පාඨමාලාවට අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම යෝග්‍යතා පරීක්ෂණය **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,** හා **කැලණිය විශ්වවිද්‍යාලය** මගින් ඒකාබද්ධව පවත්වනු ලැබේ. **විද්‍යාවේදී ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය ගෞරව උපාධි පාඨමාලාව** සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ට තමන්ගේ අභිමතය පරිදි ඉහත සඳහන් විශ්වවිද්‍යාල අතුරින් එක් විශ්වවිද්‍යාලයක් වෙත සිය අයදුම්පත යොමු කළ හැක. අයදුම්කරුවන් සුදුසුකම් ලබන විශ්වවිද්‍යාලය සඳහා තේරීමට මෙමඟින් කිසිදු බලපෑමක් සිදු නොවේ.

අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය, අවශ්‍ය ලියකියවිලි සහ යෝග්‍යතා පරීක්ෂණයට අදාළ අනෙකුත් සියළු තොරතුරු පහත සඳහන් වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - www.sjp.ac.lk**

සියළුම අයදුම් කරුවන් <u>අදාළ වෙබ් අඩවියේ ඇති සබැඳිය (web link) ඔස්සේ මාර්ගගත ක්‍රමයට (online)</u> අයදුම්පත් යොමු කල යුතු අතර, **"ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය"** යන නමින් මහජන බැංකුවේ ගංගොඩවිල ශාඛාවේ ගිණුම් අංක **097-1-001-7-001-4075** දරණ ගිණුමට බැර කරන ලද රු. **1,500/=** ක ලදුපතෙහි ස්කෑන් පිටපතක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් යොමු කළ හැකි අවසන් දිනය: 2023 ඔක්තෝම්බර් 08**

**යෝග්‍යතා පරීක්ෂණය කාළ සටහන:**

| පරීක්ෂණය | දිනය | වේලාව |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | 23.10.2023 | පෙ.ව. 09.00 – පෙ.ව. 10.00 |
| ප්‍රායෝගික පරීක්ෂණය | 23.10.2023 | පෙ.ව. 11.30 – ප.ව. 06.00 |
| | 24.10.2023 | පෙ.ව. 08.00 – ප.ව. 06.00 |

ලේඛකාධිකාරි
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.
11/09/2023